# මහජන බැංකුව

# ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා අරාධනයයි

## " අංක 374, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02 පිහිටි මහජන බැංකු කාර්යාල ගොඩනැගිල්ලේ යෝජිත අභ්‍යන්තර

## නිර්මාණ කටයුතු සිදුකිරීම (1 වන පැකේජය)"

## ටෙන්ඩර් අංක: 015/2024

1. ප්‍රධානී - ගොඩනැඟිලි ඉංජිනේරු සේවා, මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව, 6 වන මහල, 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02, විසින් පහත විස්තර කරන පරිදි **"යෝජිත මහජන බැංකු කාර්යාල ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ කටයුතු (1 වන පැකේජය)"** සඳහා සුදුසුකම් සහිත ටෙන්ඩර් කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 720.0 කි. (අගය එකතු කල බදු රහිත)

2. යෝජිත ගොඩනැගිල්ල අංක 374, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටා ඇත. මෙම අභ්‍යන්තර නිර්මාණ කටයුතු යටතේ යෝජිත මහජන බැංකු කාර්යාල ගොඩනැගිල්ලේ, ගෘහ භාන්ඩ බෙදුම් බිත්ති, සිවිලිම්, විදුලි වැඩ ආදිය සඳහා ඉදිකිරීම්, සැපයීම්, සවිකිරීම් සහ/හෝ ස්ථානගත කිරීම්, සම්පූර්ණ කිරීම්, පරීක්ෂා කිරීම්, භාරදීම් සහ නඩත්තු කිරීම් වලින් සමන්විත වේ. මහජන බැංකු මූලස්ථාන ගොඩනැගිල්ල සඳහා අභ්‍යන්තර නිර්මාණ කටයුතු යටිමහල් තුනකින් (03 Basement Floors), බිම් මහලකින්, 1 වන මහලේ සිට 22 වන මහල දක්වා දක්වා සිදු කිරීමට නියමිතය. යෝජිත මහජන බැංකු මූලස්ථාන ගොඩනැගිල්ලේ මුළු බිම් ප්‍රමාණය ව. මී 17,922 කි.

3. ඉදිකිරීම් කාල සීමාව දින 273 කි.

4. ටෙන්ඩර් කැඳවීම ජාතික තරඟකාරී ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුව සිදු කෙරේ.

5. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සලකා බලනු ලැබීම පිණිස සුදුසුකම් ලබන ටෙන්ඩර්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කොන්ත්‍රාත් නාම ලේඛනයෙන් ඉවත් කර නොමැති විය යුතු අතර, එහි SP1

විශේෂ ශ්‍රේණියේ හෝ ඊට වඩා වැඩි ශ්‍රේණියක, පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර සඳහා වලංගු ලියාපදිංචිය සතු විය යුතු වේ.

i. ඇලුමිනියම් වැඩ සහ නිමාවන් (Aluminium & Finishes)
ii. බිම, බිත්ති සහ සිවිලිම් නිමාවන් (Floor, Wall & Ceiling Finishes)
iii. ගෘහ භාණ්ඩ, උපකරණ සහ උපාංග (Furniture, Fittings & Equipments)

6. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමේ අවශ්‍යතා පහත පරිදි වේ.

❖ පසුගිය වසර 5 තුල ඉටු කරන ලද අභ්‍යන්තර නිර්මාණ කටයුතුවල සාමාන්‍ය වාර්ෂික වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 300 (රු. 300,000,000/=) ක් විය යුතුය.

❖ අවම වශයෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් රුපියල් මිලියන 200 ක වටිනාකමින් යුතු අභ්‍යන්තර නිර්මාණ කටයුත්තක් ගොඩනැගිල්ලක සාර්ථකව නිම කර තිබීම.

❖ මෙම කොන්ත්‍රාත්තුව සඳහා ද්‍රවශීල වත්කම් වල අගය සහ / හෝ අනුමතව ඇති ණය පහසුකම් අනිකුත් කොන්ත්‍රාත් බැඳීම් හා අත්තිකාරම් හැර ශුද්ධ ශේෂය රුපියල් මිලියන 240 ට නොඅඩු විය යුතුය.

7. උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්හට කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, මහජන බැංකු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ 6 වන මහලේ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානී - ගොඩනැගිලි ඉංජිනේරු සේවා වෙතින් තවදුරටත් තොරතුරු (දුරකථන අංක 011-2473206 / ෆැක්ස් අංකය 011-2341591) ලබා ගත හැකි අතර, 2024.04.30 දින සිට 2024.05.20 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව. 4.00 දක්වා රාජකාරි දිනවල ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කල හැක.

8. උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන් ඉහත ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සහ රුපියල් හැට දහසක (60,000/=) ආපසු නොගෙවන ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් 2024.04.30 දින සිට 2024.05.20 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා රාජකාරි දිනයන්හි දී සම්පූර්ණ ටෙන්ඩර් ලියවිලි කට්ටලයක් මිල දී ගත හැක.

9. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අනු පිටපතකින් ද යුක්තව වම් කෙළවරේ **"යෝජිත මහජන බැංකු කාර්යාල ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ කටයුතු (1 වන පැකේජය)"** යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර වල බහා මුද්‍රා තබා ඉහත ලිපිනයේ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට හෝ ලියාපදිංචි තැපෑලෙන් 2024.05.21 දින ප.ව. 3.00 ට පෙර ප්‍රධානී - ගොඩනැගිලි ඉංජිනේරු සේවා, මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 06 වන මහල, නො.75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් වැසූ විගස විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගී වීමට කැමති

ටෙන්ඩර්කරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

10. ටෙන්ඩරය වැසූ දින සිට 2024.10.15 දින දක්වා ලන්සුව වලංගු විය යුතුය.

11. සියළුම ටෙන්ඩර් රුපියල් මිලියන7.5 ක් (7,500,000.00) සඳහා වන ලන්සු ඇපකරයක් සමඟ ඉදිරිපත් කල යුතුය. ලන්සු ඇපකරය මහජන බැංකුව හැර ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත ඕනෑම වාණිජ බැංකුවකින් ලබා ගත යුතු අතර, ටෙන්ඩරය වැසූ දින සිට 2024.11.12 දින දක්වා වලංගු විය යුතුය.

12. ටෙන්ඩර් පිළිබඳ පූර්ව රැස්වීමක් 2024.05.07 දින පෙ.ව. 10.00 ට ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව, මහජන බැංකුව, 06 වන මහල, 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 හි දී පැවැත්වේ.

**ප්‍රධානී - ගොඩනැඟිලි ඉංජිනේරු සේවා**
**මහජන බැංකුව,**
**ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව,**
**ප්‍රධාන කාර්යාලය, 6 වන මහල,**
**75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**